# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1715/25 - 2011 ජූලි 21 වැනි බ්‍රහස්පතින්දා - 2011.07.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

සී.එෆ් 1/64.

**(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනත**

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 5 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලද නියෝගය.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2011 ජූලි මස 21 වැනි දින,
කොළඹ දී ය.

නියෝගය

1. මේ නියෝගය 2011 අංක 5 දරන හදිසි අවස්ථා (පළාත් පාලන ආයතන පරිපාලන) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 2011.02.28 වන දින අංක 1695/4 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද, 2011 අංක 3 දරන හදිසි අවස්ථා (පළාත් පාලන ආයතන පරිපාලන) නියෝගයේ කුමක් සඳහන් වුව ද, මේ නියෝගයේ උපලේඛනයේ II වන තීරයේ නිශ්චිතව දැක්වෙන දිනයේ සිට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ, මේ නියෝගයේ උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දැක්වෙන ප්‍රාදේශීය සභාවල නියෝජිතයන් තෝරාපත් කර ගැනීම සඳහා ඡන්ද විමසීමක් පවත්වන දිනය දක්වා බලපවත්වන පරිදි ඉහත කී ප්‍රාදේශීය සභාවල කටයුතු පරිපාලනය කිරීම එකී උපලේඛනයේ IV වන තීරයේ නිශ්චිතව නම් සඳහන් කර ඇති නිලධරයන් වෙනුවට, මේ නියෝගයේ උපලේඛනයේ III වන තීරයේ නිශ්චිතව නම් සඳහන් කර ඇති තැනැත්තන් වෙත පවරා ඇති බවත් එම නිලධරයන් විසින් එම පරිපාලන කටයුතු ක්‍රියාත්මක කරන බවටත්, ඉටුකරන බවටත්, කරනු ලබන බවටත් සළකනු ලැබිය යුතු ය.

උපලේඛනය

| *I වන තීරය* | *II වන තීරය* | *III වන තීරය* | *IV වන තීරය* |
|---|---|---|---|
| 1. පුතුකුඩුඉරිප්පු ප්‍රාදේශීය සභාව | 2011.04.11 | එන්. ජෙයකාන්තන් මහතා, ප්‍රාදේශීය ලේකම්, පුතුකුඩුඉරිප්පු. | එන්. කෝනේෂ්වරන් මහතා, ප්‍රාදේශීය ලේකම්, පුතුකුඩුඉරිප්පු. |
| 2. යටිනුවර ප්‍රාදේශීය සභාව | 2011.04.28 | වත්සලා මාරඹගේ මහත්මිය, වැඩ බලන පළාත් පාලන සහකාර කොමසාරිස්, මහනුවර. | ඩබ්ලිව්. එම්. වික්‍රමරත්න මහතා, ප්‍රාදේශීය ලේකම්, යටිනුවර. |
| 3. උකුවෙල ප්‍රාදේශීය සභාව | 2011.04.28 | ඩී. ආර්. බී. නිශාන්ත බණ්ඩාර කරුණාතිලක මහතා, පළාත් පාලන සහකාර කොමසාරිස්, මාතලේ. | එල්. ඒ. සුජාතා විජේසිංහ මහත්මිය, ප්‍රාදේශීය ලේකම්, උකුවෙල. |

1A - G 14607 — 830 (2011/09)

*උපලේඛනය (සම්බන්ධිතයි)*

| *I වන තීරය* | *II වන තීරය* | *III වන තීරය* | *IV වන තීරය* |
|---|---|---|---|
| 4. අක්මීමන ප්‍රාදේශීය සභාව | 2011.06.07 | සී. සී. මුහන්දිරම් මහතා, පළාත් පාලන සහකාර කොමසාරිස්, ගාල්ල. | පරණගමගේ ප්‍රියන්තා දමයන්ති මහත්මිය, ප්‍රාදේශීය ලේකම්, අක්මීමන. |
| 5. හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව | 2011.06.07 | දික්හේනේගෙදර සිරිමෙවන් ධර්මසේන මහතා, ප්‍රාදේශීය ලේකම්, හිඟුරක්ගොඩ. | ටී. ඒ. ඩී. ඩබ්ලිව්. දයානන්ද මහතා, ප්‍රාදේශීය ලේකම්, හිඟුරක්ගොඩ. |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.